5 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන තේමා පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

5.1 ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම

- වෙළෙඳ ගිණුම
- ලාභාලාභ ගිණුම

5.2 ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය අනාවරණය කිරීම

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරමු.

තම උනන්දුව හා කැපවීම මත සහන් අබේනායක, ව්‍යාපාරික ක්ෂේත්‍රයට පිවිසි තැනැත්තෙකි. ඔහුගේ පාසල් මිතුරෙකු වූ වෘත්තියෙන් ගණකාධිකාරවරයෙකු ලෙස කටයුතු කරන නාමල් ජයසිංහ මහතා සමග සිදු වූ දෙබස පහත දක්වේ. එම දෙබස ගැන ඔබගේ අවධානය යොමු කරන්න.

සහන් ආයුබෝවන් ! නාමල් මහත්මයා. ඔබතුමා මුණගැසීමත් සතුටක්.

නාමල් ආයුබෝවන්. ඔබතුමා දැන් ව්‍යාපාරිකයෙක් නේ ද ? ඔබේ ව්‍යාපාරය ගැන විස්තර කතා කළොත් ?

සහන් මගේ ව්‍යාපාරය පටන්ගෙන තවම අවුරුද්දක්වත් නැහැ. මුලින්ම මා ළඟ ඉතිරි කර ගෙන තිබූ මුදලයි, මීට යොදු වේ. මාසයකට විතර පස්සෙ බැංකුවෙන් රු. 200,000 ණය මුදලක් ලබා ගත්තා.

නාමල් ඔබේ ව්‍යාපාරය සාර්ථක බවක් බැලූ බැල්මට නම් පෙනෙනවා. ව්‍යාපාරයේ ගනුදෙනුවල විස්තර සටහන් කර තබා ගන්නවා නේ ද ?

සහන් ඔව්. තරමක් දුරට. ලැබෙන මුදල් වැයවෙන මුදල් පිළිබඳවත් අනෙකුත් බිල්පත්, ඉන්වොයිසි ආදී දේත් ලිපි ගොනුවක රැස් කරනවා. ඉතින් ..... මේ ගැන ඔබතුමාගේ වටිනා අදහස් දැන ගැනීමට කැමතියි.

නාමල් ඔව්. මුලින්ම ගනුදෙනුව සිදු වන විට ඊට අදාළ ඉන්වොයිසි, ලදුපත්, වවුචර ආදී ලිපි ලේඛන වෙනම ම රැස් කර තබා ගැනීම වැදගත්. ඊට පසුව, ඒවා වාර්තා කිරීම කළ යුතුයි. අඩු තරමින් වර්ෂයකට වරක්වත් අවසාන ගිණුම් වාර්තා පිළියෙල කිරීම කළ යුතුයි.

සෑම විටම අප උත්සාහ ගත යුත්තේ, ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට. ආයෝජනය කළ මුදලට ලැබෙන ලාභය වැඩි කර ගන්නට ඕන. හොඳ මූල්‍ය ශක්තියකින් යුතුව ව්‍යාපාරය පවත්වා ගැනීම වැදගත්.

සහන් ගිණුම් කටයුතු පවත්වා ගෙන යාමට අමතර කාලයක්, වෙහෙසක්, වියදමක් දැරීමට සිදු වෙනවානෙ

නාමල් ඒක එහෙම තමයි. එහෙම වුනත්, අපි ව්‍යාපාර සාර්ථක කර ගන්නට ඕන නම් නිවැරදිව ව්‍යාපාරයේ පවතින තත්ත්වය අවබෝධ කර ගන්න ඕනෙ. බැංකු ණය ආදිය ලබා ගැනීමට, ආදායම් බදු ගෙවීම් ආදී කාර්යයන්ටත් ඉදිරි සැලසුම් සැකසීමට ගිණුම් වාර්තා වැදගත් වෙනවා.

ඉහත දක් වූ දෙබස කියවීමෙන් ගිණුම් වාර්තා විධිමත්ව පවත්වා ගැනීමේ වැදගත්කම ඔබට පැහැදිලිවනු ඇතැයි සිතමි. එසේ නම් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ සකස්කරනු ලබන්නේ කෙසේ දැයි විමසා බලමු.

නොමිලේ බෙදහැරීම සඳහා ය.

හැඳින්වීම

ඕනෑම කාර්යයක නිරත වීමෙන් පසු එම කාර්ය තුළින් ලැබූ ප්‍රතිඵලය, සාර්ථක අසාර්ථක බව සොයා බැලීම වැදගත්වනු ඇත. එමගින් ඉදිරි කටයුතු වඩාත් සාර්ථක කර ගැනීමට පදනම සකසා ගත හැකිවේ. තව ද උනන්දුවක් දක්වන පාර්ශවවලට යම් යම් තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සපයා ගැනීමට හැකිවනු ඇත.

මේ අනුව ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර සංවිධානවල ගිණුම් කාල සීමාව තුළ ඉපයූ ලාභය හෝ අලාභය හෙවත් කාර්ය සාධනය බැලිය යුතු වේ. ඒ සමඟම සත්‍ය හා සාධාරණ ලෙස මූල්‍ය තත්ත්වය අනාවරණය කර ගැනීම ද කළ යුතුය.

මෙම පරිච්ඡේදයේ දී පහත සඳහන් මූලික යෙදුම් පිළිබඳ ව ඔබගේ අවධානය යොමු කෙරේ.

- විකුණුම් ආදායම
- වෙළෙඳ ගිණුම
- ලාභාලාභ ගිණුම
- වියදම්
- ශේෂ පත්‍රය
- වගකීම්
- විකුණුම් පිරිවැය
- දළ ලාභය
- ආදායම්
- ශුද්ධ ලාභය
- වත්කම්
- හිමිකම්

5.1 ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව වඩාත් අවධානය යොමු කරන්නේ ගිණුම්කරණ ක්‍රියාවලියේ අවසාන නිමැවුම් වන මූල්‍ය ප්‍රකාශ කෙරෙහිය. ව්‍යාපාර විසින් පිළියෙල කරනු ලබන පහත සඳහන් මූල්‍ය වාර්තා දෙක ඒ අතර ප්‍රධාන වේ.

* වෙළෙඳ හා ලාභාලාභ ගිණුම
* ශේෂ පත්‍රය

වෙළෙඳ හා ලාභාලාභ ගිණුම පිළියෙල කිරීමෙන් ගිණුම් කාල සීමාව තුළ ඉපැයූ ලාභය/අලාභය හෙවත් මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කෙරේ. එලෙස ගණනය කරන ලාභය/අලාභය පියවර දෙකකින් ඉදිරිපත් කෙරේ. එනම්,

* වෙළෙඳ ලාභය/අලාභය හෙවත් දළ ලාභය/අලාභය
* ශුද්ධ ලාභය/අලාභය වේ.

වෙළෙඳ ගිණුම (Trading Account)

භාණ්ඩ හා සේවා අලෙවි කිරීමේ කාර්යයෙහි නියුක්ත ව්‍යාපාරයක වෙළෙඳ ලාභය හෙවත් දළ ලාභය ගණනය කිරීම සඳහා වෙළෙඳ ගිණුම පිළියෙල කරනු ලබයි. මෙහි දී වැදගත් වන ප්‍රධාන කොටස් දෙකකි.

* විකුණුම් ආදායම
* විකුණුම් පිරිවැය හෙවත් විකුණූ බඩුවල ගත් මිල

විකුණුම් ආදායම

අත්පිට විකුණුම් හා ණයට විකුණුම්වල එකතුව මුළු විකුණුම් වේ. විකුණූ භාණ්ඩ යම් යම් හේතු මත ව්‍යාපාරය වෙත ආපසු එවන බව ඔබ දන්නා කරුණකි. මෙලෙස සිදු කෙරෙන ආපසු එවුම් හෙවත් හැර වූ විකුණුම් මුළු විකුණුම්වලින් අඩු කරනු ලබයි. එවිට ලැබෙන ප්‍රතිඵලය ශුද්ධ විකුණුම් වේ.

		රු.
නිදසුන	අත්පිට විකුණුම්	145,000
	ණයට විකුණුම්	68,000
		213,000
	අඩු කළා ආපසු එවුම්	3,000
	ශුද්ධ විකුණුම්	210,000

විකුණුම් පිරිවැය

විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දී පහත සඳහන් අයිතම සැලකිල්ලට ගත යුතු වේ.

* ආරම්භක ඉතිරි බඩු තොගය
* ගැනුම්
* ආපසු යැවුම් හෙවත් හැර වූ ගැනුම්
* ගෙන ඒමේ කුලී
* අවසාන ඉතිරි බඩු තොගය

නොමිලේ බෙදහැරීම සඳහා ය.

එක් ගිණුම් කාල සීමාවක අවසාන භාණ්ඩ තොගය ඊළග ගිණුම් කාල සීමාවේ ආරම්භක ඉතිරි බඩු තොගය වේ.

නිදසුන ගිණුම් කාල සීමාව 20xx.01.01න් ආරම්භ වී 20xx.12.31න් අවසන් වන වර්ෂය වේ. ගිණුම් කාල පරිච්ඡේදය ආරම්භය වන 20xx.01.01 දින පැවැති රු.8,000ක භාණ්ඩ තොගය, ඊට පෙර වර්ෂය වන 20xx.12.31 දින පැවැති රු.8,000 භාණ්ඩ තොගයම වේ. අලුතින් ආරම්භ කළ ව්‍යාපාරයක එවැනි ආරම්භක තොගයක් නැත. මෙම ආරම්භක තොගය විකිණීම සඳහා යොදා ගත් විට විකුණුම් පිරිවැයේ කොටසක් බවට පත් වේ.

ගිණුම්කාල සීමාව තුළ විකිණීම සඳහා ආරම්භක බඩු තොගය ප්‍රමාණවත් නො වේ. එබැවින් අලුතින් භාණ්ඩ මිල දී ගත යුතු ය. එලෙස අත් පිට මුදලට මිල දී ගන්නා භාණ්ඩ, අත්පිට ගැනුම් ලෙසටත්, ණයට මිල දී ගන්නා භාණ්ඩ, ණයට ගැනුම් ලෙසටත් හැඳින්වේ. ව්‍යාපාරයට ගෙන ආ භාණ්ඩ, යම් යම් හේතු මත සැපයුම්කරුවන් වෙත ආපසු යැවීමට සිදු වන බව ඔබ දැනටමත් දන්නා කරුණකි. එලෙස සිදු කෙරෙන ආපසු යැවුම් හෙවත් හැරවූ ගැනුම්, මුළු ගැනුම්වලින් අඩු කරනු ලබයි. එවිට ලැබෙන ප්‍රතිඵලය ශුද්ධ ගැනුම් වේ.

		රු.
නිදසුන	අත්පිට ගැනුම්	78,000
	ණයට ගැනුම්	46,000
		124,000
	අඩු කළා ආපසු යැවුම්	4,000
	ශුද්ධ ගැනුම්	120,000

මිල දී ගත් භාණ්ඩ (ගැනුම්) සම්බන්ධයෙන් සෘජු ව ම දරා ඇති වියදම් ද සැලකිල්ලට ගත යුතු වේ. මිල දී ගත් භාණ්ඩ ව්‍යාපාරය වෙත රැගෙන ඒමේ දී ගෙන ඒමේ කුලී ගෙවීමට සිදු වේ. පැටවුම් කුලී (වැටුප්) ගෙවිය යුතු ය. මෙවැනි වියදම් සියල්ල ම විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු වේ.

ආරම්භක ඉතිරි බඩු තොගය, ගැනුම් හා ඒ ආශ්‍රිත පිරිවැය යන සියල්ලේ ම එකතුව විකිණීම සඳහා ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය වේ. එය විකුණුම් පිරිවැය නො වේ. විකුණුම් පිරිවැය ලැබෙන්නේ එලෙස විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැයෙන්, අවසාන ඉතිරි බඩු තොගය අඩු කිරීමෙනි. ගිණුම් කාල සීමාව අවසාන වන විට විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයෙන් නොවිකිණී ඇති ප්‍රමාණය **අවසාන ඉතිරි බඩු තොගය** වේ.

විකුණුම් පිරිවැය ගණනය කිරීම.

නිදසුන ව්‍යාපාරයක පහත තොරතුරු පවතී. 20xx..01.01 ඉතිරි බඩු තොගය රු.13,000ක් ද ගැනුම් රු. 120,000ක් ද ගෙන ඒමේ කුලී රු. 7,000ක් ද 20xx.12.31 ඉතිරි බඩු තොගය රු. 15,000ක් ද වේ.

	රු.
20xx.01.01 ඉතිරි බඩු තොගය	13,000
එකතු කළා ගැනුම්	120,000
ගෙන ඒමේ කුලී	7,000
විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය	140,000
අඩු කළා 20xx.12.31 ඉතිරි බඩු තොගය	15,000
විකුණුම් පිරිවැය	125,000

මීළඟට දළ ලාභය ගණනය කරන්නේ කවර අන්දමින් ද යන්න සලකා බලමු. එය සිදුකරන්නේ, විකුණුම් ආදායම සමග විකුණුම් පිරිවැය සංසන්දනය කිරීමෙනි. නැත හොත් විකුණුම් ආදායමෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි.

	රු.
විකුණුම්	210,000
අඩු කළා විකුණුම් පිරිවැය	125,000
දළ ලාභය	85,000

ඔබ දැනටමත් දන්නා පරිදි දළ ලාභය ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන්නේ වෙළෙඳ ගිණුමයි. විකුණුම් ආදායම වෙළෙඳ ගිණුමට බැර කරනු ලබයි. ආපසු එවුම් තිබේ නම් එය විකුණුම්වලින් අඩු කර දක්වයි. විකුණුම් පිරිවැය වෙළෙඳ ගිණුමේ හර පැත්තේ පෙන්නුම් කරයි. ආරම්භක නිමි භාණ්ඩ තොගයට ගැණුම් හා ඒ ආශ්‍රිත පිරිවැය එකතු කොට විකිණීම සඳහා ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය ගණනය කර ගනී. එම වටිනාකමෙන් අවසන් තොගය අඩු කළ විට විකුණුම් පිරිවැය ලැබේ.

ඒ අනුව වෙළෙඳ ගිණුම තුලනය කර දළ ලාභය හෝ දළ අලාභය ගණනය කර ගනී. පහත දැක්වෙන තොරතුරු ඇසුරින් තිරස් ආකෘතියට අනුව වෙළෙඳ ගිණුම පිළියෙල කරමු.

නිදසුන ◉ කෝසලාගේ ව්‍යාපාරයේ තොරතුරු පහත දැක්වේ.

	රු.
විකුණුම්	567,000
ගැනුම්	295,000
ආපසු එවුම්	7,000
ආපසු යැවුම්	5,000
ගෙන ඒමේ කුලී	11,000
20xx.01.01 තොගය	8,000
20xx.12.31 තොගය	12,000

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

කෝසලාගේ ව්‍යාපාරය

20XX.12.31 න් අවසන් වර්ෂය සඳහා

වෙළෙඳ ගිණුම

	රු.	රු.		රු.	රු.
20xx.01.01 තොගය		8,000	විකුණුම්		567,000
ගැනුම්	295,000		අඩුකළා : ආපසු එවුම්		7,000
අඩුකළා : ආපසු යැවුම්	5,000				
	290,000				560,000
ගෙන ඒමේ කුලී	11,000				
		301,000			
විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය		309,000			
අඩුකළා : 20XX.12.31 තොගය		(12,000)			
විකුණුම් පිරිවැය		297,000			
දළ ලාභය ප/ගෙ		263,000			
		560,000			560,000
			දළ ලාභය ඉ/ගෙ		263,000

ආපසු එවුම් වෙළෙඳ ගිණුමේ හර පැත්තේ සටහන් නොකර බැර පැත්තේ දී විකුණුම් වලින් අඩු කර දැක්වීම සාමාන්‍යයෙන් සිදු වේ. ඊට හේතුව ශුද්ධ විකුණුම් එමගින් පෙන්විය හැකි බැවිනි. මෙලෙස ආපසු යැවුම් ද වෙළෙඳ ගිණුමට බැර කිරීම වෙනුවට හර පැත්තේ දී ගැනුම්වලින් අඩු කර දක්වයි. ඊට හේතුව, ශුද්ධ ගැනුම් එමගින් පෙන්විය හැකි බැවිනි. මේ ආකාරයට ම අවසාන ඉතිරි බඩු තොගය ද වෙළෙඳ ගිණුමට බැර කිරීම වෙනුවට හර පැත්තේ දී විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැයෙන් අඩු කර දක්වයි. එවිට විකුණුම් පිරිවැය ලැබේ.

මේ අනුව වෙළෙඳ ගිණුමේ දී විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය, විකුණුම් පිරිවැය යනාදි සංකල්ප පැහැදිලි ව ඉදිරිපත් කිරීමට මෙම ගැළපීම් වැදගත්වනු ඇත. වෙළෙඳ ගිණුම තුළින් ලැබූ දළ ලාභය, ලාභා'ලාභ ගිණුමට මාරු කරනු ලබයි.

ක්‍රියාකාරකම 01

සඳුනිගේ ව්‍යාපාරයේ පොත්පත්වලින් උපුටාගත් පහත දැක්වෙන තොරතුරු වලින් 20xx.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ ගිණුම පිළියෙල කර දළ ලාභය ගණනය කරන්න.

20xx.01.01 ඉතිරි බඩු තොගය	30,000
වර්ෂයේ ගැනුම්	325,000
වර්ෂයේ විකුණුම් ආදයම	475,000

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ආපසු යැවුම්	10,000
ආපසු එවුම්	5,000
ගෙන ඒමේ කුලී	90,000

පහත දැක්වෙන තොරතුරු ද උපයෝගී කර ගන්න.

i. 20xx.12.31 ඉතිරි බඩු තොගය 21000

ලාභාලාභ ගිණුම (Profit and Loss Account)

දළ ලාභය හෝ දළ අලාභය ගණනය කිරීමෙන් පසු ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය ගණනය කෙරේ. එය, ලාභාලාභ ගිණුම පිළියෙල කිරීම මගින් සිදු වේ.

වෙළෙඳ ගිණුම පිළියෙල කිරීම මෙන් ම ලාභාලාභ ගිණුම පිළියෙල කිරිම ද සිදුවන්නේ ගිණුම් කාල සීමාවට අදළ ආදයම් හා වියදම් ගැළපීම තුළිනි. උපචිත සංකල්පයට අනුව සිදු කරන එම ගැළපීම් සම්බන්ධව ඔබ දැනටමත් අවබෝධයක් ලබා ගෙන ඇත. ඒ ගැන නැවත අවධානය යොමු කිරීම වැදගත් වේ.

ලාභාලාභ ගිණුමට ඇතුළත් වන මූලිකාංග වන්නේ ද අයභාර වියදම් හා අයභාර ආදයම්ය. මෙම ආදයම් හා වියදම් පිළිබඳ තොරතුරු වැඩි දුරටත් විමසා බලමු.

ලාභාලාභ ගිණුමට ඇතුළත් කරන ආදයම්

ලාභාලාභ ගිණුමට ඇතුළත් කරන ආදයම් මූලික කොටස් දෙකකි. එනම්,

- වෙළෙඳ ආදයම්
- වෙළෙඳ නොවන ආදයම් වේ.

වෙළෙඳ ආදයම් යනු ප්‍රධාන ව්‍යාපාරික කටයුතු තුළින් උපයන ආදයම්ය.

නිදසුන් ◉ වෙළෙඳ ව්‍යාපාරයක නම් දළ ලාභය, ලැබූ වට්ටම්, ලැබූ කොමිස් යනාදිය.

වෙළෙඳ නොවන ආදයම් යනු ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වලින් බැහැරව වෙනත් ආකාරයකින් උපයන ආදයම් ය.

නිදසුන් ◉ වෙළෙඳ ව්‍යාපාරයක් ලබන ආයෝජන ආදයම්, කඩ කුලී ආදයම්, පොලී ලැබීම්, ස්ථාවර වත්කම්, විකුණුම් ලාභ, යනාදිය.

ඉහත දැක්වූ වෙළෙඳ ආදයම් හා වෙළෙඳ නොවන ආදයම් යන දෙවර්ගය ම ව්‍යාපාරයක සිදු කෙරෙන මෙහෙයුම් ආදයම් වේ.

ලාභාලාභ ගිණුමට ඇතුළත් කරන අයභාර වියදම් වන්නේ වෙළෙඳ ගිණුමේ දී විකුණුම් පිරිවැය ගණනයේ දී සැලකිල්ලට ගනු ලැබූ අයභාර වියදම් හැරුණු විට ශේෂ පිරික්සුමේ ඉතිරිව පවතින අනෙකුත් අයභාර වියදම් ය. ගැළපීමට ලක් වූ වියදම් ලාභාලාභ ගිණුමේ දක්වනු ලබන්නේ පහත සඳහන් වියදම් ශීර්ෂ යටතේ ය.

- ආයතන හා පරිපාලන වියදම්
- විකුණුම් හා බෙදහැරීමේ වියදම්
- මූල්‍ය හා වෙනත් වියදම්

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ආයතන වියදම් යනු ව්‍යාපාර ආයතන නඩත්තු කිරීමේ දී දරනු ලබන වියදම් ය. ගොඩනැගිලි කුලී ගෙවීම්, විදුලි ගාස්තු, වරිපනම්, ගොඩනැගිලි අලුත්වැඩියා වියදම්, ගොඩනැගිලි ක්ෂය වීම යන ආදිය ඊට නිදසුන් වේ.

ව්‍යාපාරයක පරිපාලන කටයුතු සඳහා දරන වියදම් පරිපාලන වියදම් වේ. කාර්යාල වියදම්, පරිපාලන වේතන, තැපැල් හා දුරකථන ගාස්තු, යන්ත්‍ර ක්ෂය වීම යනාදිය ඊට නිදසුන් වේ.

භාණ්ඩ විකිණීම් කටයුතු වෙනුවෙන් දරන වියදම් විකුණුම් වියදම් වන අතර බෙදා හැරීමේ කටයුතු සඳහා දරන වියදම්, බෙදාහැරීමේ වියදම් වේ. ප්‍රචාරණය, විකුණුම් කොමිස්, වෙළෙඳ සේවක වේතන, දුන් වට්ටම්, බොල් ණය, විකුණුම් වියදම්වලට නිදසුන් වේ. ගෙන යාමේ කුලී, බෙදාහැරීමේ රථ ක්ෂය වීම් යනාදිය බෙදාහැරීමේ වියදම්වලට නිදසුන්ය.

ව්‍යාපාරයක් ණය මුදල් සම්පාදනය කර ගැනීමේ දී දරනු ලබන වියදම් මූල්‍ය වියදම් වේ. බැංකු ණය පොලී, බැංකු අයිරා පොලී, බැංකු ගාස්තු යනාදිය මූල්‍ය වියදම්වලට නිදසුන් වේ.

ඉහත දැක් වූ වියදම් වර්ගවලට අයත් නොවූ වියදම් සහ අලාභ ද දැකිය හැකි ය. ඒවා වෙනත් වියදම් වේ. හානි වූ බඩු තොග අලාභ, මුදල් වංචා අලාභ, ගිනි හානි, පරිත්‍යාග යනාදිය ඊට නිදසුන්ය.

වෙළෙඳ ගිණුම පිළියෙල කිරීම තුළින් ලැබූ දළ ලාභය හෝ අලාභය ලාභාලාභ ගිණුමට ඇතුළත් කෙරේ. එසේ වනුයේ වෙළෙඳ ගිණුමත් ලාභාලාභ ගිණුමත් යන කොටස් දෙක ම එකට පිළියෙල කරන බැවිනි. එසේ වුව ද අධ්‍යයනයේ පහසුව සඳහා වෙළෙඳ ගිණුම වෙනම ම පිළියෙල කර ඇත. පහත දැක්වෙන නිදසුන අනුව ලාභාලාභ ගිණුම ද වෙන ම පිළියෙල කෙරේ. එහි දී තිරස් ආකෘතිය භාවිතයට ගෙන ඇත.

නිදසුන් කෝසලාගේ ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 20xx.12.31 දිනෙන් අවසන්වේ. වෙළෙඳ ගිණුම පිළියෙල කිරීමෙන් පසු උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

දළ ලාභය	221,000
ලැබූ වට්ටම්	6,000
ලැබූ කොමිස්	3,500
ගොඩනැගිලි කුලී හා වරිපනම්	20,000
රක්ෂණ ගාස්තු	5,000
ප්‍රචාරණ වියදම්	17,800
බැංකු ගාස්තු	2,000
ආයෝජන ආදායම්	4,500
යන්ත්‍ර විකුණුම් ලාභ	13,200
පරිපාලන වේතන	48,000
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය වියදම්	2,500
දුන් වට්ටම්	3,200
වෙළෙඳ සේවක වේතන	35,000

බොල්ණය	6,200
මෝටර් රථ වාර්ෂික ක්ෂය වීම	8,000
ගොඩනැගිලි වාර්ෂික ක්ෂය වීම	7,500
මුදල් වංචා අලාභ	9,000
බැංකු ණය පොලී	7,000
බැංකු අයිරා පොලී	3,400

ඉහත දැක්වෙන තොරතුරුවලින් කෝසලාගේ ව්‍යාපාරයේ ලාභාලාභ ගිණුම පහත දැක්වෙන පරිදි පිළියෙල කළ හැකි ය.

කෝසලාගේ ව්‍යාපාරය

20xx.12.31 න් අවසන් වර්ෂය සඳහා

ලාභාලාභ ගිණුම

	රු.	රු.		රු.	රු.
ආයතන හා පරිපාලන වියදම්			ඉ/ගෙ දළ ලාභය		22,1000
			ලැබූ වට්ටම්	6,000	
ගොඩනැගිලි කුලී හා වරිපනම්	20,000		ලැබූ කොමිස්	3,500	
රක්ෂණ ගාස්තු	5,000		ආයෝජන ආදායම්	4,500	
පරිපාලන වේතන	48,000		යන්ත්‍ර විකුණුම් ලාභ	13,200	27,200
මුද්‍රණ, හා ලිපි ද්‍රව්‍ය	2,500				
ගොඩනැගිලි ක්ෂය	7,500	83,000			
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්					
ප්‍රචාරණය	17,800				
දුන් වට්ටම්	3,200				
වෙළෙඳ සේවක වේතන	35,000				
බොල් ණය	6,200				
මෝටර් රථ ක්ෂය	8,000				
		70,200			
මූල්‍ය හා වෙනත් වියදම්					
බැංකු ණය පොලී	7,000				
බැංකු අයිරා පොලී	3,400				
මුදල් වංචා අලාභ	9,000				
බැංකු ගාස්තු	2,000				
		21,400			
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට		174,600			
මාරු කළා.		73,600			
		248,200			248,200

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ලාභාලාභ ගිණුමේ දී ගණනය කර ගත් ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කර ඇත.

ශුද්ධ ලාභයක් ඇති විට ද්විත්ව සටහන වනුයේ

ලාභාලාභ ගිණුම	හර	
ප්‍රාග්ධන ගිණුම		බැර

ශුද්ධ අලාභයක් ඇති විට ද්විත්ව සටහන වනුයේ

ප්‍රාග්ධන ගිණුම	හර	
ලාභාලාභ ගිණුම		බැර

ක්‍රියාකාරකම 02

සමන්තිගේ ව්‍යාපාරයේ ගිණුම් ලිපිකරු විසින් 20xx.12.31 දිනට ඉදිරිපත් කරන ලද ශේෂ කිහිපයක් පහත දක්වේ.

වර්ෂයේ දළ ලාභය	95,000
ලද වට්ටම්	4,000
ලද කොමිස්	9,000
ලැබූ ලාභාංශ	12,000
දුන් වට්ටම්	3,000
කඩ කුලී ආදයම්	24,000
ගොඩනැගිලි ක්ෂය	5,000
ගෙන යාමේ කුලී	6,000
ගෙවූ බැංකු ණය පොලිය	7,000
බැංකු ගාස්තු	500
වරිපනම්	1,000
රක්ෂණ	1,500
මුදල් පරිත්‍යාග	2,000
ප්‍රචාරණ වියදම්	6,000
වේතන	10,000
බොල් ණය	2,000

ඉහත ගිණුම්වලට ඇතුළත් නොවූ තොරතුරු පහත දක්වේ.

1. උපචිත බැංකු ණය පොලී 1,000
   උපචිත රක්ෂණ 2,000
2. ඉදිරියට ගෙවූ ප්‍රචාරණ ගාස්තු 1,000
3. ලැබිය යුතු ලාභාංශ 12,000
4. ව්‍යාපාරයට අයත් ගොඩනැගිල්ලක් 20xx.06.01 දින සිට කුලියට දී ඇත. මාසික කුලිය රු. 2,000කි.

ඉහත දක්වූ තොරතුරු ඇසුරින් ලාභාලාභ ගිණුම පිළියෙල කොට ශුද්ධ ලාභය ගණනය කරන්න.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

5.2 ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය අනාවරණය කිරීම

ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ කණ්ඩායම් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය ගැන ද සැලකිලිමත් වෙයි. මූල්‍ය තත්ත්වය යනු යම් නිශ්චිත දිනකට ව්‍යාපාරය සතු වත්කම් හා වගකීම්වල වටිනාකම් හා ඒවායේ සංයුතියයි. මෙහි දී ව්‍යාපාරයේ සම්පූර්ණ වත්කම් ප්‍රමාණය කොපමණවේ ද? ඒවා කුමන වත්කම් ද? ඒවා ලබා ගෙන ඇත්තේ අයිතිකරු සැපයූ ප්‍රාග්ධනයෙන් ද? නැතහොත් ණය ගැනීමෙන් ද? යනා දී ලෙසට විමසිලිමත් වෙති.

යම් නිශ්චිත දිනකට පිළියෙල කරනු ලබන ශේෂ පත්‍රයක දක්නට ලැබෙන්නේ ගිණුම්කරණ සමීකරණයක අඩංගු තොරතුරු වේ. ගිණුම්කරණ සමීකරණය පහත දැක්වෙන පරිදි බව ඔබට වැටහෙනවා ඇත.

ප්‍රාග්ධනය + වගකීම් = වත්කම්

යම් කිසි දිනකට ව්‍යාපාරයක පවතින වත්කම්, හිමිකම්, හා වගකීම් හෙවත් මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරන ප්‍රකාශය ශේෂ පත්‍රය **(Balance Sheet)** යි. එය ලේඛනයක් මිස ගිණුමක් නොවේ. එලෙස පිළියෙල කරන ශේෂ පත්‍රය තුළින් ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්වයන්ට ආර්ථිකමය තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සන්නිවේදනය කෙරේ.

වෙළෙඳ හා ලාභාලාභ ගිණුම පිළියෙල කිරීමෙන් පසු ලෙජරයේ පැවති ආදයම් සහ වියදම් ගිණුම් සියල්ල පිය වී ගොස් ඇති බව ඔබ දැනටමත් දන්නා කරුණකි. එසේ නම් තවදුරටත් ලෙජරයේ ඉතිරිව පවතින්නේ වත්කම් ගිණුම්, හිමිකම් ගිණුම් හා වගකීම් ගිණුම්වල ශේෂ පමණි. එම ශේෂයන් ඇතුළත් කර ශේෂ පත්‍රය පිළියෙල කෙරේ. එලෙස පිළියෙල කරන ශේෂ පත්‍රයත් වෙළෙඳ හා ලාභාලාභ ගිණුමත් අතර සම්බන්ධතාවයක් පවති. එම සම්බන්ධතාවය නම් වෙළෙඳ හා ලාභාලාභ ගිණුම පිළියෙල කිරීමෙන් ලබන ශුද්ධ ලාභය හෝ අලාභය ශේෂ පත්‍රයේ දී ප්‍රාග්ධන ගිණුමට ගලපනු ලැබීමයි. එනම්,

- ශුද්ධ ලාභයක් නම් එය ප්‍රාග්ධනයට එකතු කරයි.
- ශුද්ධ අලාභයක් නම් එය ප්‍රාග්ධනයෙන් අඩු කර දක්වයි.

ශේෂ පත්‍රයක අයිතමයන් වන වත්කම්, හිමිකම්, වගකීම්, පිළිබඳ තොරතුරු දහවන ශ්‍රේණියේ දී ඔබ සාකච්ඡා කර ඇත. ඒ සම්බන්ධයෙන් නැවත අවධානය යොමු කර ගැනීම වැදගත්වනු ඇත.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

පහත සඳහන් නිදසුන මගින් තිරස් ආකෘතිය අනුව ශේෂ පත්‍රය පිළියෙල කරන අන්දම පැහැදිලි කර ගනිමු.

නිදසුන තාරකගේ ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 20xx.12.31 දිනෙන් අවසන් වේ. එදිනට පහත සඳහන් ශේෂ පවතී.

මෝටර් රථ	450,000
ඉඩම්	425,000
ගොඩනැගිලි	300,000
ණය ගැතියෝ	35,000
ඉතිරි බඩු තොගය	28,000
10% ආයෝජන	50,000
ණය හිමියෝ	58,000
බැංකු අයිරාව	10,000
20xx.01.01 දිනට ප්‍රාග්ධනය	650,000
ලී බඩු හා උපකරණ	30,000
ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු	5,000
15% බැංකු ණය	200,000
උකස් ණය	150,000
ලැබිය යුතු ආයෝජන ආදායම්	3,000
ඉදිරියට ලද කඩ කුලී ආදායම්	4,000
මුදල් ශේෂය	32,000
ශුද්ධ ලාභය	192,000
ගැනිලි	16,000
ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම්	15,000
මෝටර් රථ ක්ෂය වෙන්කිරීම්	90,000
ලී බඩු හා උපකරණ ක්ෂය වෙන්කිරීම්	3,000
උපචිත විදුලිය	2,000

මෙම තොරතුරුවලින් තාරකගේ ව්‍යාපාරයේ 20xx.12.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන ආකාරය පහත දැක්වේ.

තාරකගේ ව්‍යාපාරය
20xx.12.31 දිනට ශේෂ පත්‍රය

	රු.	රු.	ස්ථාවර වත්කම්	රු. පිරිවැය	රු. සමුච්චිත ක්ෂය	රු. ශුද්ධ අගය
ප්‍රාග්ධනය						
ශේෂය 20xx.01.01 දිනට	650,000					
එකතු කළා ඃ ශුද්ධ ලාභය	192,000		ඉඩම්	425,000		425,000
	842,000		ගොඩනැගිලි	300,000	15,000	285,000
අඩුකළා ඃ ගැනිලි	16,000		මෝටර් රථ	450,000	90,000	360,000
		826,000	ලී බඩු හා උපකරණ	30,000	3,000	27,000
				1205,000	108,000	1097,000
ජංගම නොවන වගකීම්						
15% බැංකු ණය	200,000					
උකස් ණය	150,000		10% ආයෝජන			50,000
		350,000				
ජංගම වගකීම්			**ජංගම වත්කම්**			
ණයහිමියෝ	58,000		ඉතිරි බඩු තොගය		28,000	
ඉදිරියට ලැබූ කඩ කුලී	4,000		ණයගැතියෝ		35,000	
උපචිත විදුලිය	2,000		ඉදිරියට ගෙවූ රක්ෂණ		5,000	
බැංකු අයිරාව	10,000		ලැ.යු. ආයෝජන ආදායම්		3,000	
		74,000	මුදල් ශේෂය		32,000	103,000
		1250,000				1250,000

ක්‍රියාකාරකම 03

අනෝමාගේ ව්‍යාපාරයේ ගිණුම් ලිපිකරු විසින් 20xx.12.31 දිනට පහත සඳහන් ශේෂ ඉදිරිපත් කර ඇත.

ප්‍රාග්ධනය	250,000
ශුද්ධ ලාභය	126,000
ගොඩනැගිලි	400,000
ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම	60,000
ගැනිලි	6,000
උකස් ණය	80,000
ඉතිරි බඩු තොගය	18,000
10% ආයෝජන	80,000
ණය හිමියෝ	27,000
ණය ගැතියෝ	25,000
ලැබිය යුතු ආයෝජන ආදායම්	8,000
ඉදිරියට ලැබූ කඩ කුලී ආදායම්	5,000
මුදල් ශේෂය	29,000
ගෙවිය යුතු විදුලිය	3,000
බැංකු අයිරාව	15,000
යන්ත්‍ර	140,000

නොමිලේ බෙදහැරීම සඳහා ය.

යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම	42,000
ලී බඩු	22,000
15% බැංකු ණය	120,000

ඉහත දක් වූ තොරතුරු ඇසුරින් 20xx.12.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

ශේෂ පත්‍රය නිවැරදිව පිළියෙල කළ විට ප්‍රාග්ධනය හා වගකීම්වල එකතු ව එහි වත්කම්වල එකතුවට සමාන වන බව ඔබට තහවුරු වනු ඇත.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී වෙළෙඳ ගිණුම, ලාභාලාභ ගිණුම, ශේෂ පත්‍රය යන කොටස් වෙන වෙන ම සාකච්ඡා කිරීම මේ වන විට සිදු කර තිබේ. ගිණුම් කාල සීමාවක් වෙනුවෙන් සකස් කරන අවසාන ගිණුම් වාර්තා පහත සඳහන් අයුරින් විය යුතු බව මීට පෙර ද සඳහන් කර ඇත. එනම්

- වෙළෙඳ හා ලාභාලාභ ගිණුම
- ශේෂ පත්‍රය

ගිණුම් කාල සීමාව සඳහා ඉදිරිපත් කර ඇති ශේෂ පිරික්සුමේ දක්වෙන අයිතම වලට ගැළපුම් සටහන් ද එක් කළ යුතු වේ. එවැනි ආකාරයක අවසාන ගිණුම් පිළියෙල කිරීමට අදාළ ව පහත සඳහන් නිදසුන ඉදිරිපත් කෙරේ.

නිදසුන පිවිතුරු වෙළෙඳ සලේ ගිණුම් වර්ෂය 20xx.12.31 න් අවසන් වේ. එදිනට ශේෂ පිරික්සුම පහත දක්වේ.

විස්තරය	හර රු.	බැර රු.
ඉතිරි බඩු තොගය 20XX.01.01	2,000	
ගැනුම්	195,000	
විකුණුම්		368,000
ලී බඩු හා උපකරණ	60,000	
ලී බඩු හා උපකරණ ක්ෂය වෙන් කිරීම 20XX.01.01		18,000
ගෙන ඒමේ කුලී	1,500	
12% බැංකු ණය		50,000
ගෙවූ බැංකු ණය පොලී	4,000	
ණය ගැතියෝ	42,000	
ණය හිමියෝ		41,000
ආපසු එවුම්	8,000	
වෙළෙඳ සේවක වේතන	25,000	
වරිපනම් හා රක්ෂණ	12,000	
ප්‍රාග්ධනය		250,000
දුන් වට්ටම්	4,500	
ලැබූ වට්ටම්		9,000
මුදල් ශේෂය	182,000	
ඉඩම් හා ගොඩනැගිලි	200,000	
	736,000	736,000

අමතර තොරතුරු පහත දැක්වේ.

01 20xx.12.31 දිනට බඩු තොගය රු. 14,000කි.
02 ලී බඩු හා උපකරණවලින් 10% සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය වෙන් කරන්න.
03 ඉදිරියට ගෙවා ඇති වෙළෙඳ සේවක වේතන රු. 1,000කි.
04 පිවිතුරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ලබා ගෙන ඇති රු.4,000 භාණ්ඩ තොගය සම්බන්ධයෙන් කිසිදු සටහනක් තබා නැත.
05 බැංකු ණය පොලී උපචිතව ඇත.
06 ගෙන ඒමේ කුලී රු. 2,000ක් ගෙවීමට ඇත.

වෙළෙඳ හා ලාභාලාභ ගිණුම සහ ශේෂ පත්‍රය පිළියෙල කරමු.

පිවිතුරු ව්‍යාපාරය
20xx.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා
වෙළෙඳ හා ලාභාලාභ ගිණුම

	රු.	රු.		රු.	රු.
20xx.01.01 තොගය		2,000	විකුණුම්		368,000
ගැනුම්	195,000		අඩුකළා : ආපසු එවුම්		8,000
අඩුකළා : භාණ්ඩ ගැනිලි	4,000				360,000
	191,000				
ගෙන ඒමේ කුලී	3,500	194,500			
විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය		196,500			
අඩුකළා : 20xx..12.31 තොගය		14,000			
විකුණුම් පිරිවැය		182,500			
දළ ලාභය ප/ගෙ		177,500			
		360,000			360,000
			ඉ/ගෙ දළ ලාභ		177,500
ආයතන හා පරිපාලන වියදම්			ලැබූ වට්ටම්		9,000
වරිපනම් හා රක්ෂණ	12,000				
ලී බඩු හා උපකරණ ක්ෂය	6,000				
		18,000			
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්					
වෙළෙඳ සේවක වේතන	24,000				
දුන් වට්ටම්	4,500				
		28,500			
මූල්‍ය වෙනත් වියදම්					
බැංකු ණය පොලී	6,000	6,000			
		52,500			
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මරු කළා		134,000			
		186,500			186,500

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

පිවිතුරු ව්‍යාපාරය

20xx.12.31 දිනට ශේෂ පත්‍රය

					සමුච්චිත	ශුද්ධ
ප්‍රාග්ධනය			ජංගම නොවන වත්කම්	පිරිවැය	ක්ෂය	අගය
				(රු)	(රු)	(රු)
20xx.01.01 ශේෂය	250,000		ඉඩම් හා ගොඩනැගිලි	200,000	-	200,000
එකතු කළා : ශුද්ධ ලාභය	134,000		ලී බඩු උපකරණ	60,000	24,000	36,000
	384,000					
අඩු කළා : ගැනිලි	4,000					
		380,000		260,000	24,000	236,000
ජංගම නොවන වගකීම්						
12% බැංකු ණය		50,000	ජංගම වත්කම්			
ජංගම වගකීම්			ඉතිරි බඩු තොග		14,000	
			ඉදිරියට ගෙවූ වෙළෙඳ		1,000	
ණය හිමියෝ	41,000		සේවක වේතන			
උපචිත බැංකු ණය පොලී	2,000		ණය ගැති		42,000	
උපචිත ගෙන ඒමේ කුලී	2,000		මුදල් ශේෂය		182,000	
		45,000				239,000
		475,000				475,000

ක්‍රියාකාරකම 04

සහන්ගේ ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 20xx.12.31 දිනෙන් අවසන් වේ. එදිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

විස්තරය	හර රු.	බැර රු.
ඉතිරි බඩු තොගය 20xx.01.01	3,000	
බෙදහැරීමේ මෝටර් රථ (පිරිවැයට)	600,000	
ගැනුම්	340,000	
විකුණුම්		725,000
10% ආයෝජන	50,000	
ප්‍රචාරණ වියදම්	12,000	
රක්ෂණ ගාස්තු	6,000	
මෝටර් රථ ක්ෂය වෙන් කිරීම 20xx.01.01		90,000
ගෙන ඒමේ කුලී	2,000	
ණය ගැතියෝ	45,000	
ණය හිමියෝ		82,000
15% බැංකු ණය		120,000
මුදල් හා බැංකු ශේෂය	259,000	
ප්‍රාග්ධනය		300,000
	1,317,000	1,317,000

20xx.12.31 දිනට නොගළපන ලද තොරතුරු පහත දැක්වේ.

1. 20xx.12.31 දිනට ඉතිරි බඩු තොගය රු. 12,000කි.
2. ආයෝජන ආදායම් උපචිතව ඇත.
3. මෝටර් රථ පිරිවැය මත 5%ක් ක්ෂය වෙන් කරන්න.
4. ඉදිරියට ගෙවා ඇති ප්‍රචාරණ වියදම් රු. 2,000කි.
5. ණය ගැතියන්ගෙන් රු. 3,000ක් බොල්ණය ලෙස කපා හරින්න.
6. බැංකු ණය ලබා ගෙන ඇත්තේ 20xx.04.01 දිනය ණය පොලී කිසිවක් ගෙවා නැත.

ඔබ විසින්,

i. 20xx.12.31 න් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ හා ලාභාලාභ ගිණුම

ii. 20xx.12.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

ක්‍රියාකාරකම 05

සදුන් වෙළෙඳ ව්‍යාපාරිකයෙකි. ඔහුගේ ව්‍යාපාරයේ දළ ලාභය ගණනය කිරීමෙන් පසු 20xx.12.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත දක්වේ.

විස්තරය	හර රු.	බැර රු.
දළ ලාභය		240,000
ඉතිරි බඩු තොගය (20xx.12.31)	25,000	
ණය ගැතියෝ	42,000	
ණය හිමියෝ		38,000
පරිපාලන වේතන	18,000	
වෙළෙඳ සේවක වේතන	32,000	
10% ආයෝජන	120,000	
15% බැංකු ණය		200,000
වරිපනම් හා රක්ෂණ ගාස්තු	16,000	
දුන් වට්ටම්	4,000	
ලැබූ වට්ටම්		7,000
බොල් ණය	3,000	
බෙදු හැරීමේ මෝටර් රථ	450,000	

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ගොඩනැගිලි	400,000	
මෝටර් රථ ක්ෂය වෙන්කිරීම් (20xx.01.01)		45,000
ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම් (20xx.01.01)		40,000
ප්‍රාග්ධනය		600,000
මුදල් හා බැංකු ශේෂය	45,000	
බැංකු ණය පොලී	15,000	
	1,170,000	1,170,000

අමතර තොරතුරු පහත දැක්වේ.

01. ආයෝජන අත්පත් කර ගෙන ඇත්තේ 20XX.04.01 දිනය. ආයෝජන ආදායම් උපචිතව ඇත.

02. 20xx.12.31 උපචිත වියදම්

පරිපාලන වේතන	රු. 6,000
වරිපනම්	රු, 1000

03. වෙළෙඳ සේවක වේතනවලින් රු. 2,000ක් වැඩි පුර ගෙවා ඇත.

04. ණය ගැතියන්ගෙන් රු. 2,000ක් බොල් ණය ලෙස කපා හැරිය යුතු ය.

05. ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමය මත වාර්ෂක ව ක්ෂය වෙන් කිරීම් පහත පරිදි වේ.

මෝටර් රථ 10%

ගොඩනැගිලි 5%

ඔබ විසින්

i. ගැළපුම් සටහන්වලට අදළ ජ'නල් සටහන්

ii.. 20xx.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා ලාභ ගිණුම

iii.. 20xx.12.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.